***2016.06.20 වැනි දින කොත්මලේ මහවැලි මහසෑය විවෘත කිරීමේ අවස්ථාවට එක් වෙමින් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා කළ කතාව.***

කඩිනම් මහවැලි ව්‍යාපාරය සාර්ථක කිරීමට ගාමිණී දිසානායක මැතිතුමා එතුමාගේ ගම් පළාත, නිවාස සියල්ලම ජලාශයට යට කළා. කොත්මලේ ජලාශයට එතුමාගේ ඉඩකඩම් යට වුණා. අපේ ඉඩම් බේරා ගැනීමට ගියොත් අපට කොත්මලේ ජලාශය තබා මහවැලියවත් කිරීමට නොහැකි වනු ඇතැයි එතුමා කියා සිටියා. ඒ වගේම එදා එතුමා කියා සිටියේ එතුමාගේ බලාපොරොත්තුව මේ ස්ථානයේ මහා සෑයක් ඉදිකිරීම බවයි.

ඒ මහා සෑයේ ඉදිකිරීම් කටයුතු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලයේ දී ආරම්භ කළ අතර ගාමිණී දිසානායක මැතිතුමාගෙන් අනතුරුව ශ්‍රීමා දිසානායක මැතිණිය, නවීන් දිසානායක ඇමැතිතුමා, මයන්ත දිසානායක මැතිතුමා ඇතුලු කණ්ඩායම මේ මහවැලි මහා සෑයේ වැඩ කටයුතු අවසන් කිරීමට සෑම උත්සාහයක්ම දැරුවා. ඒ පිළිබඳව අප එතුමන්ලාට ස්තූතිවන්ත විය යුතුයි.

මෙම මහවැලි මහා සෑය නොමැතිව කඩිනම් මහවැලි ව්‍යාපාරයේ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් වූ බව අපට කිව නොහැකියි. මහවැලි මහා සෑයේ ඉතිහාසය පිළිබඳව අපගේ ගරුතර සංඝරත්නය විශේෂයෙන් සඳහන් කළ නිසා මා ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් කතා කිරීමට යන්නේ නැහැ. අද මහවැලි මහා සෑය සංඝ රත්නය වෙත පූජා කිරීමේ උත්සවය සඳහා මටත් සහභාගි වීමට ලැබීම පිළිබඳව මම විශේෂයෙන්ම ස්තූතිවන්ත වනවා.

ගාමිණී දිසානායක අමාත්‍යතුමා වෙත අමාත්‍ය ධුරය හිමි වූයේ 1977 ජූලි මාසයේදීයි. කඩිනම් මහවැලි ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමට අප තීරණය කළේ ඉන් අනතුරුවයි. එම කටයුතු ඉටු කිරීමට හැකි බව එතුමා එදා කියා සිටියා. ඒ අනුව අපගේ පළමු වැඩකටයුත්ත වූයේ උල්හිටිය ව්‍යාපාරයයි. 1978 ජනවාරි මාසයේ දී ගාමිණී දිසානායක අමාත්‍යතුමා සහ මා වේලාසන ගොස් උල්හිටියේ පැවැති උත්සවය සඳහා සපැමිණි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාව පිළිගනු ලැබුවා. ඒ වගේම අපි මාදුරුඔය ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහාත් එකට එකතු වී කටයුතු කළා.

මේ කොත්මලේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා සහ ඉන්දීය අග්‍රාමාත්‍ය මොරාජි දේසායි මහතා පැමිණි අවස්ථාවේ දී එතුමන්ලා සමග මම ද මේ ස්ථානයේ සිටියා. අද මේ ස්ථානයේ දී ජයමංගල ගාථා ගායනා කළ සමහර දියණියන්ගේ මව්වරුන් ද එදා ජයමංගල ගාථා කියන්නට ඇති... අද මේ ස්ථානයේ සිටින වැඩිහිටියන් ගණනාවක් එදා ජයමංගල ගාථා කියන්නට ඇති... එදා මේ වේල්ලෙහි වැඩ කටයුතු අවසන් කළ දිනයේ ගාමිණී දිසානායක ඇමැතිතුමාට පැමිණීමට නොහැකි වූ අතර ඒ වෙනුවට එදින මා මේ ස්ථානයට පැමිණියා.

ඒ වගේම අපි වික්ටෝරියා ජලාශය විවෘත කරන අවස්ථාවේ දී මාග්‍රට් තැචර් අගමැතිතුමිය, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා සහ මමත් එතැන සිටියා. එදා එවැනි උත්සව ගණනාවක්

පැවැත්වුණා. එදා ඒ අවස්ථාවන්ට සහභාගිවූ අයගෙන් අද මෙහි පළමු පේලියේ සිටින්නේ ශ්‍රීමා දිසානායක මැතිණියත්, චන්ද්‍රා ගන්කන්ද මැතිතුමාත්, මමත් පමණක් බව කිව යුතුයි.

ඇත්ත වශයෙන්ම මේ කටයුතු සාර්ථක වූයේ එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා කඩිනම් මහවැලි ව්‍යාපාරය ඉදිරියට ගෙන යාම සඳහා ගාමිණී දිසානායක මන්ත්‍රීතුමාව තෝරා ගත් නිසයි. සෑම ඇමැතිවරයෙකුටම මේ කටයුතු කළ නොහැකියි. ඒ සඳහා දක්ෂයකු සිටිය යුතුයි. මේ ප්‍රධාන ජලාශ පහට අමතරව උල්හිටිය, රත්කිඳ ජලාශ ඉදි කළා. ඒ වගේම ඉඩම් අක්කර ලක්ෂ ගණනින් මේ සඳහා යට කළා.  විශේෂයෙන්ම වසභ රජතුමා, ධාතුසේන රජතුමා, මහසෙන් රජතුමා, පරාක්‍රමබාහු රජතුමා වැනි රජවරුන්ගේ කාලවලටත් වඩා වැව් ඉදිකර කුඹුරුවල වී වගාව සඳහා ඉඩම් යට කළේ ඒ කඩිනම් මහවැලි ව්‍යාපාරයෙනුයි. ඒ සම්බන්ධයෙන් ගාමිණී දිසානායක ඇමැතිතුමාට විශේෂයෙන්ම ස්තූතිවන්ත විය යුතුයි.

එතුමා මේ ව්‍යාපාර සඳහා ගත් උත්සාහය අප හොඳින් දන්නවා. ඇතැම් විට අප සමග වාද කළ අතර ඇතැම් විට අප සමඟ එකඟ වූ අවස්ථා තිබුණා. කෙසේ හෝ මේ වැඩකටයුතු එතුමා සිදු කළා. මා හැම විටම ප්‍රකාශ කරන්නේ මේ වැඩ කටයුතු වෙන කෙනෙකුට දුන්නා නම් එය සිදුවේදැයි මා නොදන්නා බවයි. ගාමිණී දිසානායක මැතිතුමාට මේ වැඩ කටයුතු සිදු කිරීම සඳහා උදව් උපකාර කළ නිලධාරීන් අතර, එන්.ජී.පී. පණ්ඩිතරත්න මැතිතුමා, ආර්.එස්. කුක් මැතිතුමා, සිවඥානම් මැතිතුමා, ලද්දුවහෙට්ටි මැතිතුමා වැනි එක් එක් ජාතීන්ට අයත් අය සිටියා.

අද අපට මහවැලි ව්‍යාපාරය තිබෙනවා. අද අපි සහල්වලින් ස්වයංපෝෂිත වී සිටිනවා. දැන් අපට ප්‍රශ්නයක් වී තිබෙන්නේ අපට වුවමනාවටත් වඩා සහල් මේ රටේ තිබීම බව මා කියන්න කැමතියි. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා 1977 දී බලයට පැමිණියේ මේ වැඩ කටයුතු ඉටු කිරීමටයි. එතුමාට ගාමිණී දිසානායක මැතිතුමා වැනි වැඩ කිරීමට දක්ෂ තවත් කිහිප දෙනෙකු සිටියා. ඒ වගේම එතුමා සමග උපාලි විජයවර්ධන මැතිතුමා සහ පෝල් පෙරේරා මැතිතුමා මහ කොළඹ වෙළඳ කලාප ආරම්භ කළා. එතුමා සහ ප්‍රේමදාස අගමැතිතුමා එකට එකතු වී නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අලුත් අගනුවරක් ඇති කර පාර්ලිමේන්තුව සහ අවශ්‍ය ගොඩනැගිලි ඇති කළා.

රණසිංහ ප්‍රේමදාස අගමැතිතුමා උදාගම් ව්‍යාපාරයෙන් නිවාස ලක්ෂ 10 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළා. රොනී ද මැල් මැතිතුමා යටතේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම ලිහිල් කර විවෘත වෙළෙඳ ආර්ථිකය ඇති කළා. ඒ වගේම ඊට අදාළ වෙළෙඳ ප්‍රතිපත්තිය ලලිත් ඇතුළත්මුදලි මැතිතුමා ඇති කළ අතර එතුමා මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය ද ස්ථාපිත කළා. එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ එවැනි දක්ෂයින් සිටියා. මේ රට විශාල ලෙස දියුණුවට පත්වූයේ එදා මේ කිහිප දෙනා සිටි නිසයි. සමහරු මගෙන් විමසා සිටින්නේ නැවත ඒ වගේ කාලයක් අපට ලැබිය හැකිද කියායි. දැන් අප පැමිණ සිටින්නේ ඊට වඩා විශාල සංවර්ධනයක් ලබන කාලයකට බව කිව යුතුයි.

එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා සිදු කළාට වඩා විශාල වැඩ කොටසක් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ මේ වසර පහේ දී අප කරන බව කියන්න කැමතියි.

හම්බන්තොට දිස්ත්‍රික්කය කර්මාන්ත කලාපවලින් පිරවීමට අප කටයුතු කරන අතර මුළු බස්නාහිර පළාත අලුත් නගරයක් බවට පත් කරනවා. ඒ සඳහා අලුත් කර්මාන්ත පැමිණෙනවා. ඩිජිටල් තාක්ෂණය සහ පරිගණක දැනුම ලබා දෙනවා. මහනුවර අලුත් නගරයක් ඇති කරන අතර පොලොන්නරුව අලුතෙන් දියුණු කරනවා. ත්‍රිකුණාමලය දියුණු කරනවා. යාපනයේ අලුත් නිවාස ඉදිකරන අතර කන්ද උඩරට ඉඩම් ලබා දෙනවා. ඒ වගේම අලුතින් රැකියා ලක්ෂ 10 ක් බිහිකරනවා.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ වාර්තා මගේ ජීවිත කාලය තුළ බිඳ දැමීමට හැකි වනු ඇතැයි මා විශ්වාස කළේ නැහැ. නමුත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා යටතේ අපට එම එය කිරීමට හැකිවී තිබෙන බව මා සතුටින් ප්‍රකාශ කිරීමට කැමතියි. ඒ වගේම ඊටත් වඩා වැඩි වැඩ කොටසක් සිදුකිරීමට හැකි වනු ඇතැයි මම විශ්වාස කරනවා.

පසුගිය යුද්ධය ආරම්භ වුයේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා රට සංවර්ධනය කරමින් සිටියදීයි. අද යුද්ධය අවසන්ව තිබුණත් සාමය ලැබුණේ නැහැ. අද මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා යටතේ සියලු ජන කොටස් ඒකරාශී කර ගෙන අපි සාමය කරා යමින් සිටිනවා. ඒ වගේම රටට අලුත් ව්‍යවස්ථාවක් සකස් කිරීමට යනවා. අප ඉදිරියට යන්නේ මේ ආකාරයටයි. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා සමග අද අප යන මේ ගමන එදා අප තනිවම ගියේ ජනතාවගේ හයෙන් පහක වරමක් ලබා ගනිමිනුයි.

අද ජාතික ආණ්ඩුවක් ඇති කිරීමට වරමක් ලැබී තිබෙනවා. ප්‍රධාන පක්ෂ අනෙකුත් පක්ෂ සමග එකට එකතු වී වැඩ කරනවා නම් එදා මහවැලිය සඳහා ආධාර ලබා දුන්නා වගේ අද අනෙකුත් වැඩ කටයුතු කිරීම සඳහා ආධාර ලබා දෙන බව ලෝකය පවසනවා. මේ යුගය ඉදිරියට ගෙන යාම සඳහා ඉඩ ලබාදිය යුතුයි. අද අපි සියලු දෙනාම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා සමග එකතු වී සිටිනවා.

යුද්ධයෙන් අනතුරුව අප බලාපොරොත්තු වූ සංවර්ධනය ලැබුණේ නැහැ. නමුත් නැවත විශාල සංවර්ධනයක් ඇති කර මේ රට දියුණු කිරීමට අපට අවස්ථාව ලැබී තිබෙනවා. එසේ නම් ඉදිරි අවුරුදු පහේ දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් අපි සියලු දෙනා එකතු වී මේ රට හදමු. වසර 20 - 30 ක් අපට අහිමි වූ අවස්ථාව, අප පසුපසට ගිය අවස්ථාවන් ගැන අප නැවත නැවතත් ලතනොවී සියලු දෙනා එකතු වී ඉදිරියට යමු යැයි මා කියන්න කැමතියි.

මහවැලි මහ සෑය සංඝ රත්නයට පූජා කරමින් මහවැලි ව්‍යාපාරය ඇති කළ, මහවැලි මහ සෑය වැඩ කටයුතු ආරම්භ කළ ගාමිණී දිසානායක මැතිතුමාට නිවන් සැප ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.